ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

# නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

# කොළඹ නගරයේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහයවීම - AIIB

ශ්‍රී ලංකා රජය විසින් නාගරික සංවර්ධන ක්ෂේත්‍රයේ ප්‍රමුඛතා ආයෝජනයක් ලෙස නාගරික පුනර්ජීවන වැඩසටහන යටතේ කොළඹ නගරයේ හා අවට ප්‍රදේශවල නිවාස ඒකක 5,500 ක් ඉදිකිරීම හා ඉඩම් ප්‍රතිසංවර්ධනය සඳහා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) වෙතින් අරමුදල් යෙදවීමක් සඳහා සාකච්ඡා කොට ඇත. මෙම ව්‍යාපෘතිය, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය (MUD & H) විසින් සංවිධානය කරනු ලබන අතර, නාගරික සංවර්ධන අධිකාරිය (UDA) විසින් ක්‍රියාත්මක කරනු ලබයි.

SCURP ව්‍යාපෘතියෙහි පවත්නා පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් හා පළපුරුදු ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම තනතුරු සඳහා ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය, රජයේ රෙගුලාසි පිළිබඳ හුරු පුරුදුතාවය හා පරිගණක සාක්ෂරතාවය අත්‍යවශ්‍ය පූර්වාවශ්‍යතාවේ.

| අනු අංකය | තනතුර | අංකය | | අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද |
|---|---|---|---|---|
| **PS - 3 තලය, අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව** | | | | |
| 01 | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (තාක්ෂණ) | 01 | (පහත 1 හෝ 2 හෝ 3) | |
| | | | 01 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම,<br>**හෝ**<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්,<br>**හෝ**<br>පිළිගත් වෘත්තීය ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම්,<br>**සමග**<br>කළමනාකරණ තලයේ, අවම වශයෙන් වසර 14 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද<br>● **කොන්ත්‍රාත් කළමනාකරණ ක්ෂේත්‍රයේ විශේෂඥතාවය සහ විදේශ අරමුදල් යෙදවූ ව්‍යාපෘතියක පළපුරුද්ද සතුවීම අමතර සුදුසුකමක් වේ.** |
| | | | 02 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම,<br>**හෝ**<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්<br>**හෝ**<br>පිළිගත් වෘත්තීය ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම්,<br>**සහ**<br>අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්, පිළිගත් වෘත්තීය ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ ආයතනික / වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකම්,<br>**සමග**<br>කළමනාකරණ තලයේ අවම වශයෙන් වසර 10 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද |
| | | | 03 | රජයේ දීපව්‍යාප්ත සේවයේ 1 පන්තිය නිලධාරියකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තනතුරක්,<br>**සමග**<br>1 පංතිය තනතුරක අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද<br>● **කොන්ත්‍රාත් කළමනාකරණ විශේෂඥතාවය සහ විදේශ අරමුදල් යෙදවූ ව්‍යාපෘතියක පළපුරුද්ද සතුවීම අමතර සුදුසුකමක් වේ.** |
| **PS 4 A තලය - අංක 01 / 2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව** | | | | |
| 02 | ඉංජිනේරු (විදුලි) | 01 | (පහත 1 හෝ 2) | |
| 03 | ඉංජිනේරු (සිවිල්) | 01 | 01 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම,<br>**හෝ**<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්,<br>**හෝ**<br>පිළිගත් වෘත්තීය ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම්<br>**සමග**<br>අදාළ ක්ෂේත්‍රයේ, සුදුසුකම් ලැබීමෙන් පසු, අවම වශයෙන් වසර 09 ක පළපුරුද්ද<br>● **කොන්ත්‍රාත් කළමනාකරණය සහ විදේශ අරමුදල් යෙදවූ ව්‍යාපෘතියක පළපුරුද්ද සතුවීම අමතර සුදුසුකමක් වේ.** |
| | | | 02 | රජයේ දීපව්‍යාප්ත සේවයේ III / II පන්තිය නිලධාරියකු හෝ ඉහළ තනතුරක් හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තනතුරක්,<br>**සමග**<br>අවම වශයෙන් III / II පන්තිය තනතුරක වසර 09 ක පළපුරුද්ද<br>● **කොන්ත්‍රාත් කළමනාකරණය හා විදේශ අරමුදල් යෙදවූ ව්‍යාපෘතියක පළපුරුද්ද සතුවීම අමතර සුදුසුකමක් වේ.** |

**නියමයන් හා කොන්දේසි :**

වැටුප් ගෙවීම්, නියමයන් හා කොන්දේසි, 2019.03.15 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව වේ. රැකියා ස්ථානය කොළඹ වන නමුත් බස්නාහිර පළාතේ ක්ෂේත්‍ර සංචාරය කිරීමට සිදුවනු ඇත.

**අයදුම් කරන පිළිවෙළ :**

අයදුම්කරුවන් විසින් www.uda.gov.lk හි පළකොට ඇති **අයදුම්පත් ආකෘතිය** අනුව අයදුම්පත් සකස් කළ යුතුවේ.

අයදුම්කරුවන් විසින්, තම ජීව දත්ත (CV), අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සමග ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහිතව සකස් කළ අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනය වෙත 2021.10.11 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. කරුණාකර අදාළ සහතිකවල පිටපත් අයදුම්පතට යාකරන්න.

01. **PS 3 සඳහා වන අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය :**
**ලේකම්,**
**නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,**
**17 වන මහල, සුහුරුපාය,**
**සුභූතිපුර මාවත, බත්තරමුල්ල.**

02. **PS 4A සඳහා වන අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය :**
**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**කොළඹ නගරයේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහයවීම (AIIB),**
**නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,**
**5 වන මහල,**
**සෙත්සිරිපාය, අදියර 1,**
**බත්තරමුල්ල.**

කරුණාකර, අදාළ අයදුම්පත බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කරන්න.

රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමුකළ යුතු අතර, නියමිත වේලාවට අයදුම්පත් ලැබීම සහතික කරනු පිණිස අයදුම්පතේ සෘජු පිටපතක් යොමු කරන ලෙසට උපදෙස් දෙනු ලැබේ.

කෙටි ලැයිස්තුගත කළ අයදුම්කරුවන්, සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනය වන විට අදාළ සුදුසුකම් සම්පූර්ණ නොකරන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවන නොලැබේ.

අදාළ අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් සම්මුඛ පරීක්ෂණ සඳහා සළකා බලනු නොලැබේ.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**කොළඹ නගරයේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහායවීම (AIIB),**
**නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,**
**5 වන මහල,**
**අදියර 1,**
**සෙත්සිරිපාය, බත්තරමුල්ල.**
**2021 සැප්තැම්බර් 23**